ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන් සඳහා ඉන්දියාවේ පැවති ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් වේ</u>

ශ්‍රී ලංකා මාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් 29 දෙනෙකු සඳහා තෙලංගානා ප්‍රාන්තයේ නීති සහ රාජ්‍ය පරිපාලන මධ්‍යස්ථානයේ ආචාර්ය MCR මානව සම්පත් සංවර්ධන ආයතනයේ පැවති මාධ්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන සාර්ථකව අවසන් විය. දෙසතියක් පුරා පැවති මෙම පුහුණු වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය ලබා දුන්නේ ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය යි. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා අද දින කොළඹ මහ කොමසාරිස් කාර්යාලයේ දී මෙම කණ්ඩායම හමු වී පුහුණු වැඩසටහන පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසීය.

2. 2027 ජූනි 24 වන දින සිට ජූලි 07 වන දින දක්වා පැවති වැඩසටහනේ අරමුණ වූයේ මුද්‍රණ, විද්‍යුත්, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය යන විවිධ ක්ෂේත්‍රවල වත්මන් මාධ්‍ය පිළිවෙත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන් සඳහා දැනුම සහ කුසලතා ලබා දීමයි. මෙම පුහුණුව සඳහා කෘත්‍රිම බුද්ධිය වැනි නව සහ නැගී එන තාක්ෂණයන් භාවිතය සහ වැරදි තොරතුරු සහ චුවමනාවෙන් ම විකෘති කරන ලද තොරතුරු පාලනය කිරීම සඳහා ක්‍රමෝපායන් ඇතුළු මාධ්‍ය ක්ෂේත්‍රයේ නවතම ප්‍රවණතා පිළිබඳ පාඨමාලා ඇතුළත් විය. යහ පාලනය ප්‍රවර්ධනය කිරීමෙහිලා සමාජ මාධ්‍යවල තීරණාත්මක කාර්යභාරය ගවේෂණය කළ ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන් පිරිස ප්‍රවෘත්ති මැදිරිවල ඩිජිටල් පරිවර්තනය සහ දත්ත පදනම් කරගත් වාර්තාකරණය සම්බන්ධ නව කුසලතා ද අත් කර ගත්හ.

3. මෙම ධාරිතා ගොඩනැගීමේ පුහුණුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉන්දීය තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතා වැඩසටහන (ITEC) යටතේ

පිරිනමන ලදී. 1964 දී පිහිටුවන ලද ITEC වැඩසටහන ගිණුම්කරණය, විගණනය, බැංකුකරණය සහ මූල්‍ය, සයිබර් තාක්ෂණය; පරිසරය සහ දේශගුණික විපර්යාස, කළමනාකරණය සහ නායකත්වය; මානව සම්පත් සංවර්ධනය, සැලසුම්කරණය, ලොජිස්ටික් සහ කළමනාකරණය; මාධ්‍ය සහ ජනමාධ්‍යකරණය, නගර සැලසුම්කරණය; සාගර සහ ගුවන්යානා ඉංජිනේරු විද්‍යාව සහ කාන්තා සවිබලගැන්වීම ඇතුළු පුළුල් පරාසයක පැතිරි විවිධ ක්ෂේත්‍ර 25ක පාඨමාලා පිරිනමනු ලබයි. ශ්‍රී ලංකාව ප්‍රමුඛතම ITEC සහකාර රටක් වන අතර ඒ යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය සේවකයන් සහ පුරවැසියන් සඳහා සිය කුසලතා වර්ධනය කරගැනීමට අවකාශ සලසාලමින් සෑම වසරකම පූර්ණ අනුග්‍රාහකත්වය සහිත අවස්ථා 400ක් පමණ ලබා දේ. ITEC පිළිබඳ වැඩි විස්තර සඳහා www.itecgoui.in වෙබ් අඩවියට පිවිසෙන්න.

***

*කොළඹ*
*2024 ජූලි 10*